# ශ්‍රී ලංකා වෛද්‍ය සභාව (SLMC)

## ඇබෑර්තු

## නීති නිලධාරී

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව (SLMC) විසින්, එම ආයතනයේ නීති ඒකකය වෙත නීති සහාය ලබාදීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් පත් කරනු ලබන සුදුසුකම් ඇගයීම් පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකදී, මෙම දැන්වීමෙහි නිර්දිෂ්ඨ සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් අතරින් ඉහලම ලකුණු ලබාගත් අය මෙම තනතුරට පත්කරනු ලැබේ. අදාළ සුදුසුකම් ඇගයුම් සම්මුඛ පරීක්ෂණ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් අනුමත කළ ලකුණු ලබාදීමේ ක්‍රමවේදයට අනුකූලව පවත්වනු ලැබේ.

**අවශ්‍ය සුදුසුකම් :**

**වෘත්තීය/ අධ්‍යාපනික සුදුසුකම්:**

- නීතිඥවරයකු (AAL) වශයෙන් ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දී සිටින අයකු විය යුතුය.

**පළපුරුද්ද :**

නීතිඥවරයෙකු ලෙසට දිවුරුම් දීමෙන් පසුව වසර තුනකට (03) නොඅඩු ක්‍රියාකාරී වෘත්තීමය සහ අභිචෝදක කටයුතු සම්බන්ධයෙන් පළපුරුද්ද සතුවිය යුතුය. (ක්‍රියාකාරී වෘත්තීය පළපුරුද්ද සනාථ කරනු පිණිස ඉදිරිපත් කරනු ලබන ලේඛනවල පළපුරුද්ද සම්බන්ධව අදාළ කාලය, දිනය හා සහතික කරනු ලබන අයගේ නිල මුද්‍රාව පැහැදිලිව සඳහන් විය යුතුය.)

**හෝ**

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු ලෙස දිවුරුම් දීමෙන් පසුව, රජයේ ආයතනයක නීති නිලධාරී තනතුරක * අවම වශයෙන් වසර තුනක (03) සේවා පළපුරුද්ද තිබිය යුතුය. (මෙම කරුණු, අමාත්‍යාංශ ලේකම්/ දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ප්‍රධානී විසින් නිකුත් කළ ලිපියක් මගින් තහවුරු කළ යුතු අතර, එයට එකී පළපුරුද්ද අදාළ වන නීති නිලධාරී තනතුරුවලට අදාළ බඳවා ගැනීමේ මූලික සුදුසුකම් ඇතුළත් විය යුතුය.)

* **නීති නිලධාරී තනතුරක් යනු මූලික බඳවා ගැනීමේ සුදුසුකම් ලෙස වන නීති උපාධියක් ලබා තිබීම හෝ නීතිඥවරයෙකු ලෙස දිවුරුම් දී තිබිය යුතු තනතුරක් වේ.**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීති උපාධියක් (LLB) හෝ වෙනත් පශ්චාත් උපාධි සුදුසුකම් ලබාතිබීම අමතර සුදුසුකම් ලෙස සලකණු ලැබේ.

**භෞතික සුදුසුකම් :**

සෑම අයදුම්කරුවකුම අදාළ තනතුරෙහි කාර්යභාරය නිසි පරිදි ඉටු කිරීම සඳහා යහපත් මානසික හා ශාරීරික සුවණතාවයෙන් යුක්ත විය යුතුය.

**රාජකාරී හා වගකීම් :**

- විනය පරීක්ෂණ නඩු කටයුතුවල පැමිණිල්ල මෙහෙයවීම (මූලික සාක්ෂි මෙහෙයවීම, හරස් ප්‍රශ්න ඇසීම, නැවත ප්‍රශ්න ඇසීම සහ විභාග කටයුතු අවසානයේ සාක්ෂි සම්පිණ්ඩනය කරමින් ලිඛිත දේශන ගොනු කිරීම.)
- වෛද්‍ය සභාවේ නීති ප්‍රධානීගේ මග පෙන්වීම යටතේ වෛද්‍ය සභාව හා සම්බන්ධ සියලු නෛතික/ ව්‍යවස්ථාදයක කරුණු සඳහා සහය විය යුතුය.
- වෛද්‍ය සභාවේ නීති ප්‍රධානීගේ මග පෙන්වීම යටතේ වෛද්‍ය සභාවට සම්බන්ධ නෛතික/ ව්‍යවස්ථාදයක කරුණුවලදී නීතිපති දෙපාර්තමේන්තුව, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව හා සෞඛ්‍ය අමාත්‍යාංශයේ නීති ඒකකය සමග නිතිපතා සම්බන්ධීකරණයෙන් කටයුතු කළ යුතුය.

**සේවයේ යෙදවීමේ නියමයන් :**

- මෙම තනතුර ස්ථිරය.
- මෙම තනතුරට පත් කිරීම වසර තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත.
- තනතුරට අදාළ වගකීම් හා රාජකාරී කටයුතු (යොමු කිරීමේ අනුදේශ) තෝරාගත් අයදුම්කරුහට ලබාදෙනු ඇත.
- තෝරාගත් අයදුම්කරු, සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාර අරමුදලට දායක විය යුතුය.
- මෙම තනතුර සඳහා අර්ධකාලීන / කොන්ත්‍රාත් පදනමින් සේවය කිරීම සඳහා අයදුම්කිරීමටද කටයුතු කළ හැක. අදාළ කොන්ත්‍රාත්තුමය පත්කිරීම ස්ථිරව වසර තුනක් (03) සඳහා වන අතර, කාර්යසාධනය මත දෙවන ධුරකාලයක් සඳහා යළි පත්කිරීමට අවකාශ ඇත.

**වැටුප් පරිමාණය :**

- ස්ථිර තනතුර සඳහා වැටුප : MM1-2-2016 රු. 54,550-10X1,375-15X1,910 = රු. 96,950/-
- කොන්ත්‍රාත්තුමය වැටුප හා අනෙකුත් දීමනා සම්බන්ධව ශ්‍රී ලංකා වෛද්‍ය සභාව තීරණය කරනු ඇත.

**වයස :**

- අයදුම්පත් භාරගනු ලබන අවසාන දිනයට අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන්හට ඉහළ වයස් සීමාව අදාළ නොවේ.)
- කොන්ත්‍රාත්තුමය පත්කිරීම් සඳහා වයස් සීමාව : අදාළ රජයේ චක්‍රලේඛ ප්‍රකාරව වේ.

**අයදුම් කිරීමේ ක්‍රමවේදය :**

අයදුම්කරුවන් විසින්, තම සම්පූර්ණ ජීවදත්ත ඇතුළත්ව ආවරණ ලිපියක් (රජයේ ආයතනයක අයදුම්කරුවකු වෙනොත් අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් අයදුම්කරු අදාළ තනතුරට තෝරාගත හොත් දැනට දරනු ලබන තනතුරින් නිදහස් කළ හැකිද යන කරුණු සඳහන් කොට) සමග එහි ඔහු/ ඇය තනතුර දැරීමට ඇති සුදුසුකම් මතු කොට දක්වමින් අයදුම්පතක් **පහත සඳහන් ලිපිනය වෙත 2025 මාර්තු 17 දින හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතුය.** අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ **"නීති නිලධාරී තනතුරට බඳවා ගැනීම"** යනුවෙන් සඳහන් කොට ලියාපදිංචි තැපෑලෙන් හෝ ඊමේල් මගින්, වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරී වෙත එවිය යුතුය.

**සටහන :** තම අයදුම්පත්වල අසත්‍ය හෝ නිරවද්‍ය නොවන තොරතුරු සඳහන් කරනු ලබන අයදුම්කරුවන්ගේ අයදුම්පත්, පත්වීම සිදු කිරීමට පෙර සනාථ වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත. එවන් නොමග යවන සුළු කරුණු පත්වීම ලද පසුව හෙළි වුවහොත් අදාළ විනය ක්‍රියාපටිපාටින් ප්‍රකාරව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ඇත.

**ලේඛකාධිකාරී,**
**ශ්‍රී ලංකා වෛද්‍ය සභාව,**
**31, නොරිස් කැනැල් පාර, කොළඹ 10.**
registrar@slmc.gov.lk